සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Remove Watermark Now

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 1 |
|---|---|---|---|---|---|---|---|

නම / විභාග අංකය :..........................................................................................................

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලදී 1, 2, 3, 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

01. බෝසතාණන් වහන්සේගේ, අවසන් උපත සඳහා නුවණින් විමසා බැලීම හඳුන්වන්නේ
1. සත්‍ය ක්‍රියා කිරීම නමින් ය. 2. පංච මහා විලෝකනය නමින් ය.
3. දුෂ්කර ක්‍රියා කිරීම නමින් ය. 4. මහා අභිනිෂ්ක්‍රමණය නමින් ය.

02. රාජකීය කුමරකු වශයෙන් සිදුහත් බෝසතාණෝ අවශ්‍ය ශිල්ප හා ශාස්ත්‍ර පිළිබඳ විශේෂ පුහුණුවක් ලැබූහ. සිදුහත් කුමරුට ශිල්පය ඉගැන්වූ ගුරුවරයා වන්නේ,
1. කාලදේවල බමුණු පඬිතුමා ය. 2. කොණ්ඩඤ්ඤ බමුණු පඬිතුමා ය.
3. සර්වමිත්‍ර බමුණු පඬිතුමා ය. 4. භාර්ගව බමුණු පඬිතුමා ය.

03. වෙනත් කිසිදු උපතක දක්නට නොලැබුණු ආශ්චර්යවත් සිදුවීම් රැසක් බෝසත් උපතත් සමඟ සිදුවිය. එම සිදුවීම්වලට <u>අදාළ නොවන</u> පිළිතුර වනුයේ,
1. උපන් විගස පියවර තැබීමයි.
2. උපන් විගස සිංහනාද පැවැත්වීමයි.
3. උපන් විගස සත් පියුම් මත වැඩීමයි.
4. උපන් විගස කුමරු පිය රජුගේ දෝතට පිළිගැන්වීමයි.

04. සිදුහත් කුමරු යසෝදරා කුමරිය සමඟ විවාහ දිවියට පත්වූයේ,
1. දොළොස් හැවිරිදි වියේදී ය. 2. සොළොස් හැවිරිදි වියේදී ය.
3. පසළොස් හැවිරිදි වියේදී ය. 4. අටළොස් හැවිරිදි වියේදී ය.

05. අරලියතැන්න ගමෙහි වාසය කරන සුනිමල් මහතා තම කුළුඳුල් දරුවා අපේක්ෂාවෙන් ගර්භණීව සිටින තම බිරිඳ වන නිමාලි මහත්මියට ආශිර්වාදය ලබා දීම සඳහා ඇය සමග ගමේ විහාරස්ථානයට ගොස් ලොකු හාමුදුරුවන් වහන්සේට වැඳ එකත්පසව හිඳ ගත්තේය. එහිදී ලොකු හාමුදුරුවන් වහන්සේ ඇයට ආශිර්වාද පිණිස දේශනා කළ පිරිත් සූත්‍රය ලෙස හැඳින්විය හැක්කේ,
1. මෝර පිරිත ය. 2. දසදිසා පිරිත ය.
3. ජය පිරිත ය. 4. අංගුලිමාල පිරිත ය.

06. අකුසල් කිරීමට මුල් වන සිතුවිලි තුන
1. අලෝභ, අදෝස, අමෝහ නම් වේ. 2. ලෝභ, දෝස, මෝහ නම් වේ.
3. ලෝභ, දෝස හා අමෝහ නම් වේ. 4. තණ්හා, මාන, දිට්ඨි නම් වේ.

07. බුදුදහමට අනුව බෞද්ධයකු වීමේ පළමු පියවර වන්නේ,
1. නමස්කාර පාඨය තෙවරක් ප්‍රකාශ කිරීම ය. 2. ශබ්ද නගා පන්සිල් සමාදන් වීම ය.
3. තෙරුවන් සරණ යාම ය. 4. නිරන්තරයෙන් පන්සල් යාම ය.

08. තමා විසින්ම පිළිපැද ඇස් පනා පිටම මෙලොවදීම ප්‍රතිඵල දැක ගත හැකිවීම ධර්ම රත්නයේ,
1. ස්වාක්ඛාත ගුණයයි. 2. සන්දිට්ඨික ගුණයයි.
3. අකාලික ගුණයයි. 4. ඒහිපස්සික ගුණයයි.

Remove Watermark Now

09. බුදුදහමේ පරම නිෂ්ඨාව වන නිර්වාණයෙහි පදනම වන්නේ "ශ්‍රද්ධාවයි". ශ්‍රද්ධාව පිළිබඳ වඩාත් ගැළපෙන පිළිතුර වන්නේ,
1. ධර්ම ශ්‍රවණය කිරීමෙන් ඇති කරගන්නා පැහැදීම ශ්‍රද්ධාව යි.
2. අවවාද ඇසීමෙන් ඇතිකර ගන්නා පැහැදීම ශ්‍රද්ධාව යි.
3. සිල් රැකීමෙන් ඇතිකර ගන්නා පැහැදීම ශ්‍රද්ධාව යි.
4. තෙරුවන් ගුණ දැන ඇතිකර ගන්නා පැහැදීම ශ්‍රද්ධාව යි.

10. ගිහි බෞද්ධයන් රැකිය යුතු නිත්‍ය සීලය වන්නේ
1. පංච සීලයයි. 2. අෂ්ටාංග සීලයයි. 3. දස සීලයයි. 4. ආජීව අෂ්ටමක සීලයයි

11. ත්‍රිවිධ රත්නයේ ගුණ ගණනින්,
1. විස්සකි. 2. විසි දෙකකි. 3. විසි හතරකි. 4. විසි අටකි.

12. සිදුහත් කුමරු සතර පෙර නිමිති දැකීමෙන් අවබෝධ කරගත් සත්‍ය වන්නේ,
1. මෙලොව මිනිසුන් වයසට ගොස් ලෙඩවී මරණයට පත් වන බවයි.
2. තමන්ට ද මෙම තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවන බවයි.
3. තමන්ට මේ කිසිවක් අදාළ නොවන බවයි.
4. තමන්ට මෙම තත්ත්වයන්ට මුහුණදීමට සිදු නොවන බවයි.

13. බෞද්ධයන්ට ආදර්ශවත්ම පිරිස වන්නේ මහා සංඝරත්නයයි උන්වහන්සේලා තම දෛනික කාර්යයන් සිදුකරනු ලබන්නේ,
1. තම ගුරු හිමිවරුන්ගේ කීම අනුවය.
2. තම දායකයන්ගේ කීම අනුවය.
3. විනය ශික්ෂාවන්ට අනුකූලවය.
3. රටේ පාලකයන්ගේ කීම අනුවය.

14. සිත කිලිටි කරන, නිවන් මඟ අවුරන, කෙලෙස් ධර්ම පහක් බුදු දහමේ සඳහන්වේ. ඒවා,
1. පංච නියාම ධර්ම නම් වේ.
2. පංච නීවරණ ධර්ම නම් වේ.
3. පංච ආනන්තරීය කර්ම නම් වේ.
4. පංච දුශ්චරිත නම් වේ.

15. බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගයෙහි ගමන් කළ හෙයින් ද, සුන්දර වූ නිවනට සැපත් වූ හෙයින් ද, දෙලොවටම වැඩ ඇති හෙයින් ද, යහපත් වචන පවසන හෙයින් ද,
1. අරහං නම් වන සේක.
2. සම්මා සම්බුද්ධ නම් වන සේක.
3. සුගත නම් වන සේක.
4. ලෝකවිදූ නම් වන සේක.

16. සමන් පොහෝ දිනක විහාරස්ථානයට ගොස් බුදු පිළිම වහන්සේ ඉදිරිපිට බද්ධ පර්යංකයෙන් වාඩි වී, නමස්කාර පාඨය කියා, තෙරුවන් සරණ ගොස්, පන්සිල් සමාදන් ව, අරහං ආදි ගුණ සිහිපත් කරමින් සූදානම් වන්නේ,
1. මෛත්‍රී භාවනාව වැඩීම පිණිස ය.
2. ආනාපානසති භාවනාව වැඩීම පිණිස ය.
3. බුද්ධානුස්සති භාවනාව වැඩීම පිණිස ය.
4. මරණානුස්සති භාවනාව වැඩීම පිණිස ය.

17. සිදුහත් කුමරු සුප්‍රබුද්ධ ශාක්‍ය රජුගේ රූමත් දියණිය වූ යසෝදරාවන් සමග විවාහ විය. යශෝදරාව හඳුන්වන තවත් නමක් වනුයේ,
1. බුද්ධ මාතා නමිනි.
2. භද්දකච්චායනා කුමරිය නමිනි.
3. බද්ධාකාපිලානි කුමරිය නමිනි.
4. මිගාර මාතාව නමිනි.

18. <u>"මෙවන් පුතෙකු ලද මවක්, පියෙක්, නිවුණෝවෙති"</u>යනුවෙන් නිබ්බුත පද ප්‍රකාශ කරන ලද්දේ,
1. විශාඛා සිටු දියණිය විසිනි.
2. සුජාතා සිටු දියණිය විසිනි.
3. සුමනා සිටු දියණිය විසිනි.
4. කිසාගෝතමී සිටු දියණිය විසිනි.

19. කර්මස්ථාන ආචාර්යවරයකුගේ මගපෙන්වීමක් නොලබා තම අභිමතය පරිදි සාර මසක් මුළුල්ලේ භාවනා කොට ප්‍රතිඵලයක් නොලැබුවේ,
1. සැරියුත් හිමිය. 2. ස්වර්ණකාර හිමිය. 3. චුල්ලපන්ථක හිමිය. 4. පුණ්ණා හිමිය.

Remove Watermark Now

20. බුදු දහමේ සඳහන් පරිදි භාවනා වැඩීමට පිවිසෙන තැනැත්තා ඉටුකරගත යුතු පූර්ව අවශ්‍යතා අතරින් එකකි, සිල්වත්වීම. සීලය යනු,
1. සිත සහ කය යන දෙකෙහි සංවරයයි. 2. සිත සහ වචනය යන දෙකෙහි සංවරයයි.
3. කය සහ වචනය යන දෙකෙහි සංවරයයි. 4. කය සහ සිත යන දෙකෙහි සංවරයයි.

21. පංචස්කන්ධය නිවැරදිව සඳහන් පිළිතුර වන්නේ,
1. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන්නයි. 2. ඇස, කන, නාසය, දිව, ශරීරය යන්නයි.
3. රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන්නයි. 4. පඨවි,ආපෝ,තේජෝ, වායෝ, ආලෝක යන්නයි.

22. කුලතුංග බණ්ඩාර නම් පින්වත් කුමරු වැලිවිට සරණංකර හිමි නමින් පැවිදිවූයේ,
1. ගඩලාදෙණි විහාරයේ දී ය. 2. සූරියගොඩ විහාරයේ දී ය.
3. අස්ගිරි විහාරයේ දී ය. 4. දෙමටමල් විහාරයේ දී ය.

23. ජලය කැළඹී ඇත්නම් එහි කිසිවක් නොපෙනේ. එමෙන්ම සිත කැළඹුනු විට, නොසන්සුන් වූ විට මතකය අවදි නොවේ. පංච නීවරණයන්හි මෙය හඳුන්වා ඇත්තේ,
1. ථීන මිද්ධ නමිනි. 2. විචිකිච්ඡාව නමිනි. 3. ව්‍යාපාද නමිනි. 4. උද්ධච්ච කුක්කුච්ච නමිනි.

24. සත්ත්වයා ගොඩනැගී ඇත්තේ පඨවි ආපෝ තේජෝ වායෝ යන සතර මහා භූතයන්ගෙනි. මෙහි දැක්වෙන ආපෝ යනු,
1. ද්‍රව ගතිය යි. 2. උෂ්ණ සීතල ගතිය යි. 3. තද ගතිය යි. 4.සෙලවෙන ගතිය යි.

25. සමථ භාවනාව වඩන විට ඒ ඒ චරිතයට අනුව ආචාර්යවරයෙකුගෙන් කර්මස්ථාන හෙවත් භාවනා අරමුණු ලබා ගත යුතුය. එම කර්මස්ථාන සංඛ්‍යාව,
1. 32 කි. 2. 40 කි. 3. 64 කි. 4. 108 කි.

26. ජාති ජරා ව්‍යාධි මරණ යන සසර දුක්වලින් ව්‍යාධි යනුවෙන් අදහස් කෙරෙන්නේ,
1. ඉපදීමයි. 2. මහලු වීමයි. 3. ලෙඩවීමයි. 4.මරණයට පත්වීමයි.

27. සමථ භාවනාව හැඳින්වීම සඳහා යෙදෙන වෙනත් නමක් වන්නේ,
1. ත්‍රිලක්ෂණ භාවනාවයි. 2. චිත්ත භාවනාවයි. 3. ප්‍රඥා භාවනාවයි. 4. විදර්ශනා භාවනාවයි.

28. තම පුත් කුමරු සක්විති රජ කෙනෙකු වී සැප සම්පත් ලබනු දැක්ම සුදොවුන් පියරජතුමාගේ එකම සිහිනය විය. ඒ සඳහා පියරජතුමා ගත් එක් උපක්‍රමයක් වූයේ,
1. සතර පෙර නිමිති දැකීමට සැලැස්වීම ය.
2. රම්‍ය සුරම්‍ය සුභ යනුවෙන් සුඛෝපභෝගී මාලිගා තුනක් කරවා දීම ය.
3. නිරන්තරයෙන් අනිත්‍ය මෙනෙහි කිරීමට අවස්ථාව සැලැස්වීම ය.
4. සත්‍ය ගවේෂණය කිරීමට කුමරුට අවස්ථාව ලබාදීම ය.

29. උපශාන්ත පැවිදි රුව ගැන සිත යොමු කරමින් සිටි සිදුහත් බෝසතුන්ට මාලිගයෙන් පැමිණි පණිවුඩකරුවෙකු ගෙන් අසන්නට ලැබුණේ යසෝදරා දේවිය පුතෙකු ලද බවයි. එවිට කුමරු ගේ මුවින් පිටවූ යේ,
1. “අග්ගෝහමස්මි ලෝකස්ස” යන පාඨයයි.
2. “අනේක ජාති සංසාරං” යන පාඨයයි.
3. “රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං” යන පාඨයයි.
4. “අප්පමාදේන සම්පාදේථ” යන පාඨයයි.

30. ලෙඩවීම, මහලුවීම, මරණය ට පත් වීම, අප සැමට පොදු ධර්මතාවයකි. මෙම ජීවිත යථාර්ථයට සැම සත්වයෙකුම මුහුණ දිය යුතුය. එසේ නම් අප කළ යුත්තේ,
1. ප්‍රශ්න ඉදිරියේ හඬා වැටීමයි. 2. නිතරම සතුටින් කාලය ගත කිරීමයි.
3. අභියෝග ජයගෙන කටයුතු කිරීමයි. 4. ප්‍රශ්නවලින් පලා යෑමයි.

Remove Watermark Now

31. ත්‍රි සිංහලය එක්සේසත් කොට දුටුගැමුණු කුමාරයා සිරිලක රාජ්‍යත්වයට පත් විය. එතුමා එළාර රජු සහ අවසන් වරට යුද වැදුනේ,
1. හස්ති ශෛලපුරදී ය. 2. පුලස්තිපුරදී ය. 3. සෙංකඩගලපුරදී ය. 4. විජිතපුරදී ය.

32. වැලිවිට අසරණසරණ සරණංකර සංඝරාජ හිමිපාණන් වහන්සේ විසින් රචිත ග්‍රන්ථයක් වන්නේ
1. බුදුගුණ අලංකාරයයි. 2. සාරාර්ථ සංග්‍රහයයි. 3. සුභාෂිතයයි. 4. ලෝවැඩ සඟරාවයි.

33. සියම් දේශයෙන් උපාලි හිමියන් ප්‍රමුඛ උපසම්පන්න භික්ෂූන් පිරිසක් මෙරටට වැඩම කරන ලද්දේ,
1. රාජාධිරාජසිංහ රජ දවසේදී ය. 2. කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවසේදී ය.
3. ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජ දවසේදී ය. 4. විජය රාජසිංහ රජ දවසේදී ය.

34. ආනාපානසති භාවනාව වැඩීමේදී පුරුෂ පක්ෂයේ අයෙකු හිඳිය යුතු ඉරියව්ව වන්නේ
1. බද්ධ පර්යංකයෙන් ය. 2. අර්ධ පර්යංකයෙන් ය.
3. උක්කුටිකයෙන් ය. 4. පසඟ පිහිටුවා ගෙනය.

35. සඟ ගුණ ප්‍රකාශ වන ගාථාපාඨයෙහි **<u>"සුපටිපන්න"</u>** යන ගුණයෙන් ප්‍රකාශවන්නේ,
1. පරලොව සුව දෙන දානය පිළිගැනීමට සුදුසුය යන්නයි.
2. මනා වූ පිළිවෙත් සපුරන නිසා යන්නයි.
3. ඇඟිලි බැඳ වැඳීමට සුදුසු වන බැවින් යන්නයි.
4. ලෝකයාගේ උතුම් පින්කෙත බඳු වූ යන්නයි.

36. සිදුහත් කුමාරයා මතු බුදුවන බවට පළමු අනාවැකිය ප්‍රකාශ කළ තැනැත්තා වූයේ,
1. කොණ්ඩඤ්ඤ බමුණා ය. 2. ආලාරකාලාම තවුසා ය.
3. සහම්පති මහා බ්‍රහ්මයා ය. 4. අසිත තවුසා ය.

37. දුටුගැමුණු රාජ්‍ය පාලන කාලය මහා වංශයෙහි සඳහන් වන්නේ, වසර ගණනින්,
1. 15 කි. 2. 18 කි. 3. 20 කි. 4. 24 කි.

38. ඔහු සෑම දේම කරන්නේ ඇත්ත ඇති සැටියෙන් නොදැන බව තාත්තා කීවේය. එසේනම් ඔහු ක්‍රියා කර ඇත්තේ,
1. ලෝභයෙනි. 2. අමෝහයෙනි. 3. ද්වේශයෙනි. 4. මෝහයෙනි.

39. තපස්සු සහ භල්ලුක වෙළඳ දෙබෑයන් යනු
1. පළමු ද්වේවාචික උපාසකවරුන් ය. 2. පළමු තේවාචික උපාසකවරුන් ය.
3. පලමු රහත් පිරිසට අයත් වූ දෙදෙනෙකි. 4. අවසන් දායකයන් දෙදෙනා ය.

40. අවුරුදු අසූවක් ලෝක ශාසන සේවයේ යෙදුණ වැලිවිට සරණංකර සංඝරාජ හිමියෝ අපවත් වූයේ,
1. වෙසක් පුර පසළොස්වක පොහෝ දිනකදී ය.
2. පොසොන් පුර පසළොස්වක පොහෝ දිනකදී ය.
3. ඇසළ පුර පසළොස්වක පොහෝ දිනකදී ය.
4. බිනර පුර පසළොස්වක පොහෝ දිනකදී ය.

papers.lk
pdfelement

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Remove Watermark Now

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 2 |

- පළමු ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව <u>ප්‍රශ්න පහකට පමණක්</u> පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද තෝරා ගත් අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින්ද හිමිවේ.

---

01 i) සිදුහත් කුමරුගේ ළමා කාලයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න.
ii) සතර පෙරනිමිති පිළිවෙලින් නම් කරන්න.
iii) නව අරහාදි බුදුගුණ අතරින් දෙකක් ලියන්න.
iv) 'රහසත් පව් නොකොට....
කෙලෙසරයනුත් දුරු කොට'....
යන කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථයේ නම කුමක්ද?
v) ධර්ම රත්නයේ ගුණ අතරින් දෙකක් නම් කරන්න.
vi) සීලය හා සම්බන්ධ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ අංග දෙකක් නම් කරන්න.
vii) පිරිහෙමින් පැවති සසුන නඟා සිටුවීමට සරණංකර සංඝරාජ හිමියන්ගේ මූලිකත්වයෙන් පිහිටුවාගත් සංවිධානය කුමක්ද?
viii) ආර්ය සත්‍ය හතර අතරින් දෙකක් නම්කරන්න.
ix) බුදුදහමට අනුව බෙදා දක්වා ඇති පුද්ගල චරිත හය අතරින් දෙකක් නම් කරන්න.
x) දෙවි කෙනෙකු බුදුරදුන් වෙත පැමිණ "ගෞතමයන් වහන්ස, ඇතුළත අවුල් ය. පිටතද අවුල් ය. සත්ත්ව ප්‍රජාව අවුලෙන් අවුලට පත්ව සිටී ය." දැන්වූ විට බුදුරජාණන් වහන්සේ දුන් පිළිතුර කෙටියෙන් ලියන්න

02 පාසලේ බෞද්ධ සංගමයේ ආරාධනයෙන් එහි වැඩම කළ ගරුතර ස්වාමීන් වහන්සේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අමතා මෙසේ දේශනා කළහ.
"බෝසත් දුවේ පුතේ, මෙතෙක් ලොව පහළ වූ ශ්‍රේෂ්ඨතම ශාස්තෘවරයන් වහන්සේ බුදුරජාණන් වහන්සේයි. බෞද්ධයන් සතු අමිල වූ මාණික්‍ය තෙරුවන් ය. තෙරුවන් සරණ යැම ගැලවුම්කරුවකුගේ පිහිට පතනවාට වඩා හාත්පසින්ම වෙනස් වූවක්"
මෙම අනුශාසනාවෙහි සඳහන්,

i) තෙරුවන් නම් කරන්න.
ii) සංඝ රත්නයේ ගුණ නවය අතරින් <u>**තුනක්**</u> ලියන්න.
iii) දිනපතා තෙරුවන් නැමදීමෙන් ශිෂ්‍යයකුට ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරන්න.

03 i) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද <u>**දෙක**</u> නම් කරන්න.
ii) භාවනාවට පිවිසෙන තැනැත්තා ඉටුකරගත යුතු පූර්ව අවශ්‍යතා (පූර්වකෘත්‍ය) පිළිබඳ පැහැදිලි කරන්න.
iii) **"භාවනාව වැඩීම නිසා ලැබුණු ප්‍රයෝජන"** පිළිබඳ බෞද්ධ සමිතියේ දී ඔබට කතාවක් කිරීමට සිදුවූයේ යැයි සිතන්න. එහිදී ඔබ ඒ සඳහා ඉදිරිපත් කරන කරුණු මොනවාදැයි විස්තර කරන්න.

04 "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසිකලෙකත් රජසැප පිණිස නොවන්නේය."

i) මෙම ප්‍රකාශය කළ රජතුමාගේ දෙමාපියන් නම් කරන්න.

ii) එම රජතුමා භික්ෂූන් වහන්සේලා කෙරෙහි දැක් වූ අති මහත් ගෞරවය හෙළිවන සිදුවීමක් පැහැදිලි කරන්න.

iii) එම රජතුමාගෙන් සිදු වූ ජාතික හා ශාසනික මෙහෙවර පිළිබඳ විස්තරයක් කරන්න.

05 i) **"විසේසේන පස්සතීති විපස්සනා"** යන්නෙහි අදහස ලියන්න

ii) විදර්ශනා භාවනාව හඳුන්වන තවත් නම් **<u>තුනක්</u>** දක්වන.

iii) ත්‍රිලක්ෂණය පිළිබඳ අවබෝධය පුද්ගල ජීවිතය අර්ථවත් වීමට බලපාන අයුරු පැහැදිලි කරන්න.

06 i) සිදුහත් කුමරු ළමා අවධියේදී ඉගෙනගත් ශිල්ප ශාස්ත්‍ර අතරින් **<u>දෙකක්</u>** නම් කරන්න.

ii) බෝසත් සිදුහත් කුමරුට උපතේ සිට අභිනිෂ්ක්‍රමණය දක්වා ඇති වූ අභියෝග රාශියකි. ඒ අතරින් **<u>තුනක්</u>** දක්වන්න.

iii) දෛනික ජීවිතයේදී ඔබට විවිධ අභියෝගවලට මුහුණපෑමට සිදුව ඇත. ඒ අතරින් එක් අභියෝගයක් ජය ගැනීම සඳහා ඔබ ගනු ලැබූ ක්‍රියාමාර්ග විස්තර කරන්න.

07 පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකකට පමණක්</u>** කෙටි සටහන් ලියන්න.

i) මහා සංඝරත්නයෙන් සිදුවන ආගමික හා සාමාජීය මෙහෙවර.

ii) පංච නීවරණ ධර්ම.

iii) සසුන් කෙත සරු කළ සරණංකර සංඝරාජ හිමිපාණන්.

iv) ආර්ය අෂ්ටාංගික මාර්ගය.

Remove Watermark Now

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

10 ශ්‍රේණිය

බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

පළමු වාර පරීක්ෂණය - 2018

papers.lk
pdfelement